වයිරස ආසාදනය



# Molluscum Contagiosum

## වැදගත් කරුණු

- Molluscum contagiosum සමේ ඇතිවන වයිරස ආසාදනයකි.
- රහස් අවයව අවට, අධෝමාර්ගය අවට සහ කිහිළි වැනි සමේ උෂ්ණය සහ තෙමනය ඇති පදෙස් වල පොදු වශයෙන් මෙම ලකුණු ඇතිවේ.
- ලකුණු සමග දද ඇතිවේ, එසේ නැත්නම් දරුවා දද ඇතිවීමට ඉඩ ඇත්නම් ලකුණු වඩා නරක අතට හැරේ.
- බොහෝමයක් Molluscum contagiosum ලකුණු මාස 6-9 අතර කිසිම ප්‍රථිකාරයක් නොමැතිව සහ කැළලක් නොමැතිව මැකී යයි.

## එය මොකක්ද?

වයස සීමාවක් නොමැතිව සෑම මණුෂ්‍ය වර්ගයාටම බලපෑ හැකි Molluscum contagiosum වෛරස ආසාදනයකි. ඉන් සම මතුපිට කුඩා ඉන්නන් වැනි ගුලි සෑදේ. ඒවා දිලිසෙන, මුතු වැනි සුදු පාට මැද මදයක් සහිතයි. එක් වරකට ලකුණු ගණන 3-4 සිට 50-60 දක්වා විශාල ලෙස වෙනස් විය හැක.

Molluscum contagiosum ලකුණු ශරීරයේ ඕනෑම තැනක ගට ගත හැකි නමුත් පොදු වශයෙන් රහස් අවයව සහ අධෝමාර්ගය අවට, කිහිළි ඇතුලත හෝ ශරීර කදේ පැති වල හට ගනී. දද හට ගෙන ඇති ළමයින්ගේ එය වඩාත් නරක අතට හැරේ. ලකුණු අවට දද ඇතිවී කැසීම හේතුකොට ගෙන ඒවා වැඩියෙන් පලල්ව පැතිරෙයි. වයිරසය සඳහා ශරීරයේ ස්වභාවික ප්‍රතිශක්තිය ගොඩනැගුන විට අවසානයේදී ලකුණු මැකී යයි. මෙයට සති කීපයක සිට වසර ගණනාවක් ගතවිය හැක. බොහෝ ලකුණු මාස 6-9 අතර මැකී යයි. දද ඇතිවීමට ඉඩ ඇති ළමයින්ට දිගු කලක් පවතිනු ඇත.

## එය වලක්වා ගත හැක්කේ කෙසේද?

Molluscum contagiosum වන්නේ එක් ආසාදනයට (infected) ලක්වූ දරුවකුගෙන් තවත් දරුවෙකුට බෝ වන වෛරස ආසාදනයකි. වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා ආසාදනයට (infected) ලක්වූ දරුවා පිහිනුම් තඨාක සහ හවුලේ නෑම, ගෙදරදි සෙසු දරුවන් සමග තුවා සහ මුණ පිස්න හවුලේ පාවිච්චි කිරීමෙන් වැළකී සිටිය යුතුය.

## එයට ප්‍රථිකාර කරන්නේ කෙසේද?

Molluscum contagiosum හා සම්බන්ධයෙන් ප්‍රථිකාරයක් අවශ්‍ය නොවන්නේ එය ප්‍රථිකාරයක් නොමැතිව හොඳ වන බැවින් සහ කිසිම කැළළක් තබා නොයන බැවින්ය. ලකුණු වල දැවිල්ලක් හෝ වේදනා සහගත ගතියක් නම් හෝ ආශ්‍රිත දදය හිරිහැර කාරී නම් වෛද්‍යවරයකුගේ ප්‍රථිකාර ලබාගන්නා ලෙස උපදෙස් දෙනු ඇත. දදයක් ඇත්නම් එය සුලු cortisone ක්‍රීම් වලින් ප්‍රථිකාර කරණු ඇත. ඇතැම්විට වෛද්‍යවරයකු නයිට්‍රොජනික දියරයකින් කැටි කරණු ඇත. කෙසේ වෙතත් මෙම ලකුණු පැල්ලමක් නොතබා සුවවෙන බැවින් දිගු කලක් පැල්ලම් ඇතිවිය හැකි ප්‍රථිකාර නොකිරීම වැදගත් වන්නේය. ලකුණු සුලු ප්‍රමාණයක් පමණක් ඇත්නම් ඒවා තුවාල වෙලන පටියක ඇලෙන සුලු අගිස්සෙන් ආවරනය කර දිනපතා මාරු කිරීමෙන් ඉක්මනින් හැලී යනු ඇත.

## Singhalese - Molluscum Contagiosum

වැඩිපුර තොරතුරු

ඔබේ මාතෘ සහ ලමා සෞඛ්‍ය හෙදිය

ඔබේ ඖෂධ වේදියා

ඔබේ පවුලේ දොස්තර මයා/මිය

චර්ම රෝග විශේෂඥයෙක් (A dermatologist)

© 2002, Department of Dermatology, St. Vincent's Hospital Melbourne, Victoria Parade, Fitzroy, Victoria 3065 Australia